**ශීර්ෂය 265 - මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදි. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වේ. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 265 - මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනයන් සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 19 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරි විසින් එම විධිවිධානයට අනුගතවී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසිය** | | | |
| 128 (1) (අ) | රජය විසින් නියම කර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම්කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම<br>2. ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්<br>3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම | 2.3.1(අ)<br>2.3.1(ආ)<br>2.3.2 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත්කරන බව | 1. පොදු තැන්පත් ගිණුමේ අඩුපාඩු<br>2. පොත්පත් හා ලේඛන පවත්වා නොතිබීම<br>3. මානව සම්පත් කළමනාකරණයේ දුර්වලතා | 2.7<br>2.8<br>2.9 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්යය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟ හිටව පැවති ණය ශේෂ අයකර ගැනිමට නොහැකි වීම | 2.6 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව | මුදල් සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පතු ලබා නොගැනීම | 2.11 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------------

### 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරයන්

-----------------------------------------------------------

(අ) දිස්ත්‍රික්කයේ පවතින සම්පත් කාර්යක්ෂමව යෙදවීමට සැලසුම් සම්පාදනය කිරීම

(ආ) මූල්‍ය කටයුතු හා භුවමාරු ක්‍රමවේදයන් නගාසිටුවීම මගින් ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම

(ඇ) කලා සංස්කෘතික හා සදාචාරකම් දිරිගැන්වීම සඳහා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම

(ඈ) දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය මට්ටමින් වන තිරසාර සංවර්ධනය

(ඉ) ආපදාවන්ගෙන් මහජනතාව ආරක්ෂා කිරීම

### 2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමගින් ඉටු කළ යුතු කාර්යභාරයන්

-----------------------------------------------------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා ඒවායේ කාර්යභාරයන් පහත දැක්වේ.

| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන | ස්ථාපිත කිරීමේ අධිකාරී බලය | කාර්යභාරය |
|---|---|---|
| මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>නානාට්ටන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>මාන්තෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>මුසාලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>මඩු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1992 අංක 58 දරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීමේ පනත | මධ්‍යම රජය සහ පළාත් සභාවලින් පවරනු ලබන පරිපාලන හා සංවර්ධන කාර්යභාරයන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ක්‍රියාත්මක කිරීම. |

**2.3 කාර්යසාධනය**

**2.3.1 කාර්යභාරයන් ඉටු නොකිරිම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රධාන කාර්යයන් 22 ක් ඉටු කිරීමට නියමිතව තිබුණත් එකතුව රු.මිලියන 1.25 ක් ප්‍රතිපාදන සලසා තිබූ ප්‍රධාන ව්‍යාපෘති 02 ක් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කරන ලද නමුත් නිම කර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම් අත්සන් කළ රු.මිලියන 1.73 ක් වටිනා මාලිගෙයිත්තිඩල් පෙර පාසල, සොර්නපුරි කාන්තා ග්‍රාමීය සංවර්ධන සමිති, පාලෙයියඩි පුදුක්කුලම් සහ කරුංකන්ඩල් ප්‍රජා ශාලාව යන ව්‍යාපෘති 04 හි වැඩ ආරම්භ කර තිබූ නමුත් අයහපත් කාලගුණය හේතුවෙන් නියමිත කාල වකවානු තුළ සම්පූර්ණ කරගත නොහැකි වී තිබුණි.

**2.3.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ප්‍රසම්පාදන සැලසුම් කිරීම හා ප්‍රාරම්භක අවධිය**

මෙම සැලැස්ම යටතේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම, වාර්ෂික යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රසම්පාදන පැකේජ සාරාංශය, ආරම්භක ප්‍රසම්පාදන සැලැස්ම, හඳුනාගනු ලැබූ ප්‍රසම්පාදනයට සම්බන්ධ විශේෂ අනුමැතිය ලබාගැනීම සඳහා අවශ්‍ය වන ලේඛන, නිර්දේශයන්, සැලසුම්, සටහන්, ඉදිකිරීම් ආදිය පිළියෙල කර නොතිබුණි.

(ආ) භාණ්ඩ සැපයීම හා සේවාවන් ලබාගැනීමේදී තිදෙනෙකුගෙන් සමන්විත ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත ප්‍රසම්පාදන තීරණය ඉටු නොකර රු.මිලියන 1.59 ක් වටිනාකමැති භාණ්ඩ ලබාගෙන තිබුණි.

**2.4 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන් | රු.මිලියන | රු.මිලියන | ප්‍රතිශතය |
| 2013 | පුනරාවර්තන | 145.25 | 144.98 | 0.28 | 0.18 |
| | මූලධන | 22.70 | 22.30 | 0.39 | 1.74 |
| | **එකතුව** | **167.95** | **167.28** | **0.67** | **0.40** |
| 2014 | පුනරාවර්තන | 170.60 | 158.76 | 11.84 | 6.94 |
| | මූලධන | 120.95 | 99.12 | 21.83 | 18.05 |
| | **එකතුව** | **291.55** | **257.88** | **33.67** | **11.55** |
| 2015 | පුනරාවර්තන | 195.22 | 193.40 | 1.82 | 0.93 |
| | මූලධන | 194.10 | 118.30 | 75.80 | 39.05 |
| | **එකතුව** | **389.32** | **311.70** | **77.62** | **19.94** |
| 2016 | පුනරාවර්තන | 212.00 | 198.00 | 14.00 | 6.60 |
| | මූලධන | 187.00 | 184.72 | 2.27 | 1.22 |
| | **එකතුව** | **399.00** | **382.73** | **16.27** | **4.08** |
| 2017 | පුනරාවර්තන | 200.79 | 195.10 | 5.69 | 2.84 |
| | මූලධන | 120.00 | 110.33 | 9.66 | 8.05 |
| | **එකතුව** | **320.790** | **305.43** | **15.35** | **4.79** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මූලධන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම සියයට 427 කින් ඉහළ ගොස් තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබූ රු.මිලියන 17.35 ක මුල් ප්‍රතිපාදන අවස්ථා 10 කදී සියයට 14 සිට සියයට 69 දක්වා අඩු කර වෙනත් පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබූ ප්‍රතිපාදන සියයට 08 සිට සියයට 520 දක්වා මුදල් රෙගුලාසි 69 ප්‍රකාරව වැඩි කර තිබුණි.

(ඇ) මූලධන වැය විෂයයන් සඳහා සලසා තිබූ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 9.64 ක ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි කර තිබුණි. මූලධන වැය විෂයයන් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට සියයට 91 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි.

## 2.5 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

වෙනත් අමාත්‍යාංශ 27 ක්, දෙපාර්තමේන්තු 17 ක්, ජනාධිපති හා අග්‍රාමාත්‍ය කාර්යාල විසින් විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට එකතුව රු.මිලියන 2,315.12 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 2,057.70 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 257.42 ක් හෙවත් සියයට 11.12 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සියයට 5 කට වැඩි වැය විෂයයන් 29 ක ඉතිරියෙහි එකතුව රු.මිලියන 59.65 ක් වූ අතර මෙය සියයට 40 සිට සියයට 100 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි. කෙසේ වුවත්, මේ සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) “දීර්ඝකාලයක් අවතැන් වූ පුද්ගලයන් සඳහා වන වැඩසටහන - 2017” ප්‍රකාරව මාලයිට්ටාන් කමම් කෘෂි මාර්ගය ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඇස්තමේන්තු පත්‍රය ප්‍රකාරව දිග මීටර් 1050 ක් හා පළල මීටර් 3.6 ක් වශයෙන් ඉදිකර තිබූ බවට පෙන්වා අවසන් ගෙවීම් සඳහා වන සනාථ කිරීමේ බිල්පත් සකසා ගෙවීම් සඳහා ඉදිරිපත් කර තිබුණි. එසේ වුවත්, භෞතික විගණන පරීක්ෂාවට අනුව දිග මීටර් 950 ක් හා පළල මීටර් 2.7 ක් වන මාර්ගයක් පමණක් ඉදිකර තිබුණි. මේ අනුව, රු.624,172 ක ගෙවීම් වැඩියෙන් සිදුකර තිබුණි.

(ඇ) “දීර්ඝකාලයක් අවතැන් වූ පුද්ගලයන් සඳහා වන වැඩසටහන - 2017” යටතේ රසූල් පුදුවෙලි වැව් බැම් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇස්තමේන්තුව අනුව මීටර් 2000 ක් දිග මීටර් 3 ක් පළල වශයෙන් ඉදිකර තිබූ බවට අවසන් ගෙවීමට අවශ්‍ය සනාථ කිරීමේ බිල්පත් සකසා ගෙවීම් සඳහා ඉදිරිපත් කර තිබුණි. භෞතික විගණන පරීක්ෂාවට අනුව මීටර් 1,500 ක් දිග මීටර් 3 ක් පළල වශයෙන් වූ මාර්ගයක් ඉදිකර තිබූ හෙයින් ගෙවිය යුතු වටිනාකම රු.483,750 ක් වශයෙන් වැඩියෙන් ගණනය කර ගෙවීම් සිදුකර තිබුණි.

(ඈ) අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2017 යටතේ නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මඩුක්කරෙයි රජයේ දෙමළ මිශ්‍ර පාසලේ ගොඩනැගිලි අලුත්වැඩියාවේදී ඇතැම් සඳහන් කරන ලද නිශ්චිත කාර්යයන් සත්‍ය වශයෙන් සිදුකරන ලද ප්‍රමාණයට වඩා වැඩියෙන් ඇස්තමේන්තුවේ සඳහන් කර තිබීම හේතුවෙන් රු.50,640 ක ගෙවීම් වැඩියෙන් සිදුකර තිබුණි. තවද, ඇතැම් වැඩවලදී ඉවත් කරනු ලැබූ උළු කැට හා රීප්ප පටි පාසැලේ දක්නට නොලැබුණි. ඇස්තමේන්තුවේ ඇතුළත් නොවූ රු.24,784 ක් වටිනා අමතර වැඩ විධිමත් පරිදි අනුමැතියක් ලබාගැනීමකින් තොරව සිදු කර තිබුණි.

(ඉ) අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2017 යටතේ මුසාලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මන්/මරුදමඩු රජයේ දෙමළ මිශ්‍ර පාසලේ ගොඩනැගිලි ඉදිකිරීමේ සඳහන් කර තිබූ ඇතැම් නිශ්චිත කාර්යයන්වල මිනුම් භෞතික විගණන පරීක්ෂාවේදී අඩුවෙන් දක්නට ලැබුණත් ඇස්තමේන්තු පත්‍රයේ වැඩියෙන් දක්වා තිබූ බැවින් වටිනාකම රු.93,830 ක් වන ගෙවීම් කොන්ත්‍රාත්කරුට වැඩියෙන් සිදු කර තිබුණි.

(ඊ) 2017 වර්ෂය සඳහා වන ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන කාර්යාලයේ (ONUR) මූලා ආධාර මත ක්‍රියාත්මක කරනු ලබන සැලසුම මඟින් වන්ද්‍රකාසන් වැව ඉදිකිරීම සඳහා වනසම්පත් දෙපාර්තමේන්තු ආඥා පනතේ 7(i) ඡේදයේ (K) වගන්තිය ප්‍රකාරව වගා කිරීමේ කටයුතු සඳහා කැලෑ විනාශ කිරීම හෝ පස් ඉවත් කිරීම හෝ හැරීමේ කටයුතු සඳහා අනුමැතිය ලබා ගැනීමකින් තොරව වැව් බැම්ම දෙපස තණකළ සිටුවීම සම්බන්ධයෙන් (Supplying fort sods to site preparation and dressing of surface) වර්ග මීටර් 570 ට වැඩියෙන් දක්වා රු.57,000 ක් වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි.

(උ) මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හරහා ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන කාර්යාලයේ (ONUR) ප්‍රතිපාදන උපයෝගී කොටගෙන 2017 වර්ෂයේ පුමලර්දාන් ගම්මානය සඳහා එකතුව රු.මිලියන 21.51 ක් වටිනා ජල ව්‍යාපෘතිය වෙනුවෙන් රු.2,512,542 ක් ජාතික ජලසම්පාදන මණ්ඩලයට ගෙවා මාස 05 ක් ගතවී තිබියදීත් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ ප්‍රතිලාභීන් සඳහා කරවල වියලීමේ උපකරණ ප්‍රසම්පාදනය සඳහා වන ඇස්තමේන්තුව, ප්‍රසම්පාදන කමිටු තීරණය මඟින් තෝරා ගෙන තිබූ ආයතනයේ ලංසු මිල ගෙවීම් වවුචර් යනාදිය භෞතික විගණන පරීක්ෂාවට ලක් කිරීමේදී ඉදිරිපත් කර තිබූ ප්‍රමාණ පත්‍ර ප්‍රකාරව ඒකක මිල රු.76,600 බැගින් වන වටිනාකමට උපකරණ 10 ක් ප්‍රසම්පාදනය

කර තිබූ බවට දක්වා තිබුණි. එසේ වුවද, ඒවා සඳහා භාවිතා කරනු ලැබූ මූලික ද්‍රව්‍යවල ප්‍රමාණයන් භෞතිකව මැනීමේදී එකක් රු.56,518 ක් වන මිලකට සැදිය හැකි වුවත් සහ ඇමුණුමේ දක්වා තිබූ ප්‍රමාණයන්ම තිබූ බැවින්, වැඩි මිලක් දැක්වීම හේතුකොට ගෙන එකක මිල රු.20,082 ක් බැගින් උපකරණ 10 සඳහා රු.200,820 ක අධි ගෙවීමක් සිදු වී තිබුණි.

(එ) 2017 වර්ෂය සඳහා වන ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන කාර්යාලයේ (ONUR) මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති මඟින් සෝලෙයියයන් කට්ටු වැව ප්‍රතිසංස්කරණය කිරීමේදී ගෙවීම් වවුචර් ප්‍රකාරව වර්ග මීටර් 2,188 ක ප්‍රමාණයකට වැව දෙපස තණකොළ සිටුවීම සඳහා රු.533,872 ක් ලබා දී තිබූ බව සඳහන් කර තිබූ නමුත් විගණන භෞතික පරීක්ෂාවේදී (100x1.5x1.5) වර්ග මීටර් 2,088 ප්‍රමාණයකට පමණක් තණකොළ සිටුවා තිබීම හේතුවෙන් රු.24,400 ක මුදලක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

## 2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විෂය අංක 26501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 17.00 | 15.52 | 10.00 | 10.94 | 50.00 | 46.87 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2017 දෙසැම්බර් 31 දිනට හිඟ හිටව පැවති රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ ශේෂවල එකතුව රු.මිලියන 2.06 ක් විය. මෙම ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා කාලයක් පැවැත එමින් තිබුණත් එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 2.7 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති පොදු තැන්පත් ගිණුම් 07 ක 2017 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂවල එකතුව රු.මිලියන 151.15 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 02 ක් ඉකුත් වූ එකතුව රු.මිලියන 12.70 ක තැන්පතු 157 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ එකතුව රු.මිලියන 1.50 ක ප්‍රතිපාදන අදාළ නිශ්චිත කාර්යයන් සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

**2.8.** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාරව එහි ඇමුණුම II |
| (ආ) | පරිගණක, මෘදුකාංග හා උපාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | චෙක්පත්, මුදල් ඇණවුම් සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 |
| (ඈ) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 854(1) |
| (ඉ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) |
| (ඊ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) |
| (උ) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ඌ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 |
| (එ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |
| (ඒ) | ඉන්ධන හා ලිහිසිතෙල් තොග පොත | මුදල් රෙගුලාසි 1647 (ඇ) |
| (ච) | ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |
| (ඪ) | ප්‍රසම්පාදන කමිටු වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන අත්පොතේ 2.11.3 හි දක්වා ඇති ආකෘති පත්‍රවලට අනුකූල වීම |
| (ක) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන අත්පොතේ 5.2.1 ආකෘති පත්‍රවලට අනුකූල වීම |

## 2.9 මානව සම්පත් කළමනාකරණය

### 2.9.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනට පැවති කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 24 | 10 | - |
| (ii) | තෘතියික මට්ටම | 19 | 01 | 18 | - |
| (iii) | ද්විතියික මට්ටම | 543 | 380 | 171 | 08 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 68 | 48 | 20 | - |
| | එකතුව | 664 | 453 | 219 | 08 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැවැති පුරප්පාඩු 219 ක් පිරවීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) බඳවාගෙන තිබූ අතිරික්ත සේවකයන් 08 දෙනා සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.10 මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරාදීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගණන්දීමේ නිලධාරියාට නියමිත කාර්යයන් එකක් හෝ ඊට වැඩි ගණනක මුල්‍ය බලතල පැවැරීමේදී පවරන නිලධාරියාගේ නමින් හෝ ධූරයෙන් හෝ නිශ්චිතව සඳහන් කර ඒ ඒ නිලධාරියාට පවරන කාර්යයන් දැක්වෙන ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ඉහත සඳහන් ලේඛනය පොදුවේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංසරණය කර නොතිබුණි.

## 2.11 රජයේ නිලධාරින් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 හි සඳහන් විධිවිධානවලට අනුව ඇප තැබිය හැකි නිලධාරීන් විසින් ඇප නොතැබීම හේතුවෙන් ඔවුන්ගේ අතපසුවීම්වලින් ඇතිවිය හැකි පාඩු හිලව් කිරීමට හැකි ආකාරයෙන් පෙර සූදානම් වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ගෙන නොතිබුණි.